# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1976/42 - 2016 ජූලි මස 22 වැනි සිකුරාදා - 2016.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2014/එච්ඩබ්/112.
*මගේ අංකය* : කේඩීඑස්/කුණ්/04/07/16/04/60 (III).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, මැණික්හින්න (705) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැණික්හින්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2016.05.19 දිනැතිව පිළියෙල කර ඇති මුලික පිඹුරු අංකය මහ 6575 දරන පිඹුරේ කැබලි අංක 1 සිට 2 දක්වා පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0080 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි (2) :

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: තන්නෙගෙදරවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන්නා : ආර්. එම්. අයි. පී. රාජපක්ෂ, නො. 47, පිටවල, මැණික්හින්න; ප්‍රමාණය: හෙක්. 0.0040.

02. **කැබලි අංක 2**

ඉඩමේ නම: ගිරවන්ගෙ වත්ත; විස්තරය: ගෙවත්ත, පැති බැම්මක් සහ පඩි පෙළක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන්නා : පී. ඒ. වීරසේකර, නො. 25, තෙල්දෙණිය පාර, මැණික්හින්න; ප්‍රමාණය: හෙක්. 0.0040.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 අගෝස්තු මස 24 වැනි දින පෙ.ව. 9.30 ට කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 අගෝස්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

සමන්ති ඩී. නාගහතැන්න,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුණ්ඩසාලේ.

2016 ජූලි මස 14 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

08 - 155

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23900 - 17 - (2016/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.